කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
அலுவலக உபயோகத்திற்கு

**ඇමුණුම - 01**

**<u>වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහාවන ජාතික අරමුදල මඟින් වැඩිහිටි දිවා මධ්‍යස්ථානවලට උපකරණ ලබාදීම සහා අරමුදල් නිදහස් කිරීම - 2021</u>**

<u>උපදෙස් පත්‍රිකාව</u>

## 01. ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීම

ග්‍රාමීය මට්ටමේදි වැඩිහිටියන්ගේ සුබසාධන හා ආදායම් උත්පාදන වැඩසටහන් හා අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට මෙන්ම සාමූහික ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් සඳහා මෙම මධ්‍යස්ථාන ප්‍රදේශයේ වැඩිහිටි පිරිසට ඉතා ප්‍රයෝජනවත් වේ. ඒ අනුව උක්ත වැඩසටහන් පැවැත්වීමට විවිධ භාණ්ඩ හා උපකරණ අවශ්‍යය වන අතර වැඩිහිටි සමිතිවලට මේ සඳහා මූල්‍යය වත්කම් නොමැත. දිවා මධ්‍යස්ථානයක වැඩිහිටියන් පෙ.ව 8 සිට ප.ව.5 පමණ වනතුරු රැස්වී වැඩසටහන් සංවිධානය කරන බැවින් ඒ සඳහා අවශ්‍යය භාණ්ඩ හා උපකරන ලබාදිම වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සංකල්පයේ සාර්ථකත්වයට ඉවහල් වේ.

ඒ අනුව සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි මෙම වර්ෂය තුළ රුපියල් 500,000.00 ක උපරිමයකට යටත්ව දිවා මධ්‍යස්ථාන 40 ක් සඳහා ප්‍රතිපාදන ලබාදීමට මුදල් වෙන්කර ඇත. මේ යටතේ 2019 හා 2020 වර්ෂවල ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ඉදිකරන ලද වැඩිහිටි දිවා මධ්‍යස්ථානවලට ප්‍රමුඛතා හිමිවේ. අවශ්‍යතාවය මත ඉහත උපරිම සීමාවට යටත්ව කොට්ඨාශයේ දිවා මධ්‍යස්ථාන කීපයකට භාණ්ඩ හා උපකරණ ලබා දීම කෙරේ විරෝධතාවයක් නොමැත. එසේ උවත් එම මධ්‍යස්ථාන සංඛ්‍යාව 4 ක් නොඉක්ම විය යුතුය.

## 02. සුදුසුකම්/ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්නායක

1. සක්‍රීය වැඩිහිටි සමිතියක් හා සම්බන්ධ දිවා මධ්‍යස්ථානයක් විය යුතු අතර වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ඉදිකරන ලද හෝ දැනට නිරවුල් ගොඩනැඟිල්ලක පවත්වාගෙන යනු ලබන වැඩිහිටි දිවා මධ්‍යස්ථානයක් විය යුතුය.
2. වැඩිහිටි සමිතියේ ඉල්ලීම් ලිපිය
3. වර්ථමාන ක්‍රියාකාරිත්වය පිළිබඳ විෂය භාර ක්ෂේත්‍ර නිලධාරිවරයාගේ වාර්තාව
4. විෂයභාර ක්ෂේත්‍ර නිලධාරීවරයාගේ නිර්දේසය සහිත පසුගිය වර්ෂයේ කළ වැඩසටහන
5. මෙම වර්ෂය සඳහා අනුමත කරන ලද යෝජිත වැඩ සැලැස්ම
6. ප්‍රාදේශිය ලේකම් ගේ අනු අත්සන සහිත භාණ්ඩ විස්තරය හා ඇස්තමේන්තුව
7. භාණ්ඩ හා උපකරණ වෙනත් පාර්ෂවයකට හෝ පුද්ගලයෙකුට නොපවරන බවට ලිපිය හා භාණ්ඩ භාරකාරිත්වය හා ආරක්ෂාව සම්බන්ධ භාරකරුගේ එකහතා ප්‍රකාශිත ලිපිය
8. ඉල්ලීම් ලැබෙන ප්‍රමුඛතා අනුපිළිවෙළ හා අවශ්‍යතාවයේ ප්‍රමුඛතාවය මත මුදල් නිදහස්

   කරනු ලබයි

9. මේ සඳහා ඉල්ලුම් කල හැකි අවසාන දිනය 2021. 07.31 වේ

## 03.ඉල්ලුම්කළ හැකි භාණ්ඩ වර්ග

1. විදුලි උපකරණ
2. ගෘහ භාණ්ඩ
3. මුළු තැන්ගේ උපකරණ
4. පුස්ථකාල පොත්
5. ගෙවතු වගා උපකරණ
6. ප්‍රථමාධාර උපකරණ
7. ක්‍රීඩා
8. වෙනත්

## 04. ක්‍රියාත්මක ක්‍රමවේදය

1. ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුව රුපියල් 500,000.00 ක මුල්‍යය ප්‍රතිපාදන සිමාව ඉක්මවා නොයා යුතුය.එසේ ඉක්මවා යන්නේ නම් එම මුදල සොයාගන්නා ආකාරය දක්වා තිබිය යුතුය.

2. එක් දිවා මධ්‍යස්ථානයක් සඳහා ලබාදෙන උපරිම මුදල වන රුපියල් 500,000.00 එක්වරක් පමණක් ලබාදෙනු ඇත.

3. සියළුම ලේඛණ හා වාර්තා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතුය

## 05. පසුවිපරම්

1. සියළුම භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කර වාර්ෂික සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කල යුතුය

2. ඒ.ඒ. අවස්ථාවේ පසු විපරම් කටයුතු දිස්ත්‍රික් නිලධාරියා විසින් සිදුකර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඡායාරූප සහිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය

3. ආදාල ලේඛණ යාවත්කාලිනව පවත්වා ගැනීමට සුදුසු උපදෙස් හා පුහුණුව වැඩිහිටි සමිතියට හා දිවා මධ්‍යස්ථාන සමාජිකයන්ට ලබාදිය යුතුය.

4. ලබාදෙන භාණ්ඩ හා උපකරනක කැඩුන අවස්ථාවල නඩත්තු හා නැවත සැකසීමට වැය වන වියදම් වැඩිහිටි දිවා මධ්‍යස්ථානය හෝ සමිතිය මඟින් දරා ගත යුතුය

**06. අයදුම්පත් හා ගිවිසුම්**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද අයදුම්පත සම්පූර්න කර ඉදිරිපත් කල යුතු අතර ඒ ඒ කාර්යයන් නිමකල වහාම මා වෙත යොමුකල යුතුය.

1. මුදල් ලද බවට ලදුපත
2. මිලදි ගත් භාණ්ඩ පිළිබ සවිස්තර වාර්තාව
3. උපකරණ හා භාණ්ඩ දිවා මධ්‍යස්ථානවලට ලබාදුන් බවට ලිපිය

අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
அலுவலக உபயோகத்திற்கு

# වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල මඟින් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන අළුත් වැඩියා කිරීමට , ඉදිකිරීමට අරමුදල් නිදහස් කිරීම - 2021

## 01.ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීම

වැඩිහිටියන්ගේ හුදකලාභාවයට හා වැඩිහිටි නිවාසවලට විකල්ප විසඳුමක් වශයෙන් මෙන්ම වැඩිහිටියන්ගේ අභිමානය, ස්වාධීනත්වය, හා සමාජ ගරුත්වය ලබාදෙමින් වැඩිහිටියන්ට සමාජය තුළ සිය අවශ්‍යතා සපුරාගනිමින් ගමේ ජීවත්වන වැඩිහිටි ප්‍රජාවගේ කායික, මානසික සතුට ප්‍රවර්ධනය තුළින් යහපත් වැඩිහිටි වියක් ගත කිරීමේ අවස්ථාව ලබා දිම.

1. වැඩිහිටි නිවාසවලට විකල්ප විසඳුමක් වශයෙන් වැඩිහිටියාට තම දූ, දරු, ඥාතී, ඇතුලු ආදරණීය සමුහයෙම ජීවත්වීමේ අවස්තාව තවදුරටත් ලබාදීම
2. සමවයස් කණ්ඩායමක් වශයෙන් දැනුම බෙදා ගැනීමට අත්දැකීම් හුවමාරුවට අවස්ථාවක් ලබාදීම.
3. දිවා මධ්‍යස්ථාන ජාලය හරහා ආදායම් උත්පාදක කුඩා ව්‍යාපෘති මගින් ආදායමක් නොමැති,
   හැකියාවැති වැඩිහිටියන්ට ආදායම් උත්පාදක අවස්තා ලබා දී වැඩිහිටියන් සවිබල ගැන්වීම.
4. ග්‍රාමීය පොදු මධ්‍යස්ථාන ආර්ථික සෞඛ්‍යය, සෞන්දර්යාත්මක, හා අධ්‍යාත්මික වැඩිහිටි මධ්‍යස්ථානය වශයෙන් සවිබල ගැන්වීම.
5. වැඩිහිටි ප්‍රාජාවගේ දැනුම අත්දැකීම් මතු පරපුර වෙත ලබාදීම හා වැඩිහිටි භාවය පිළිබඳ සමාජය දැනුම්වත් කරන මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියාකරවීම

ග්‍රාමීය මට්ටමේදී වැඩිහිටියන්ගේ සුබසාධන හා ආදායම් උත්පාදන වැඩසටහන් හා අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට මෙන්ම ඒ, ඒ සංවිධාන වෙත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් හා වෙනත් පරිත්‍යාගශීලීන්, රාජ්‍යය නොවන සංවිධාන යනාදියෙන් ලබාදෙන භෞතික සම්පත් ආරක්ෂා සහිතව ප්‍රයෝජනයට ගැනීමට මෙම මධ්‍යස්ථාන ප්‍රදේශයේ වැඩිහිටි පිරිසට ඉතා ප්‍රයෝජනවත් වේ. ඒ අනුව සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි මෙම වර්ෂය තුළ රුපියල් මිලියන 2.5 බැගින් දිවා මධ්‍යස්ථාන 25 ක් සඳහා ප්‍රතිපාදන ලබාදීමට මුදල් වෙන්කර ඇත.

මෙම වර්ෂය සඳහා වන ඉල්ලීම් **2021 .06.30 දිනයට ප්‍රථම** ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය

## 02. සුදුසුකම් / ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක

1. ලියාපදිංචි සක්‍රීය වැඩිහිටි සමිතියක් විය යුතුයි
2. සෑම දිස්ත්‍රික්කයකින්ම එක් අයදුම්පතක් හෝ අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතු අතර එක් අයදුම්පතකට වඩා ඉදිරිපත් කරන්නේ නම් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ඉදිරිපත් කල යුතුය
3. නව ඉදිකිරීම් හා අළුත් වැඩියා යන අංශ දෙකටම මුදල් ලබාදිය හැක.
4. රජය සතු භූමියක/ ආගමික ස්ථානයක් සතු භූමියක ඉදිකළ හැකිය එහිදි අදාළ පාර්ෂවය සමඟ ගිවිසුම්ගත විය යුතුය
5. පෞද්ගලික ඉඩමක ඉදිකරන්නේ නම් එම කොටස ප්‍රාදේශිය ලේකම්වරයා වෙත පවරා දිය යුතුය
6. අදාල ඉඩම පර්චස් 10 හෝ ඊට වැඩි විය යුතුය
7. දිවා මධ්‍යස්ථානය වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අඩි 12 ක් හෝ ඊට වැඩි පිවිසුම් මාර්ගයක් විය යුතුය
8. ඝෝෂා කිරීම් හා බධා විරහිත පරිසරයක් විය යුතුය
9. ඉදිකිරීමෙන් පසු ජල හා විදුලි බිල්පත් අදාළ වැඩිහිටි සමිතිය විසින් දැරිය යුතුය
10. දිවා මධ්‍යස්ථානයේ හා භෞතික සම්පත්වල ආරක්ෂාව සම්බන්ධ විධිමත් වැඩ පිළිවෙළක් සකස්කර තිබිය යුතුයි
11. වෙනත් කාර්යයක් සඳහා දීර්සකාලීනව දිවා මධ්‍යස්ථානය සමගාමීව භාවිතා කරන්නේ නම් දිවා මධ්‍යස්ථානයේ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර ඒ සඳහා මධ්‍යස්ථානයේ එකඟතාවය ප්‍රාදේශිය ලේකම් ගේ නිර්දේශය සමග වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අනුමැතිය ලබා ගත යුතුය.

## 03. ක්‍රියාත්මක ක්‍රමවේදය

1. දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශිය ලේකම්ලේකම් නිර්දේශ සමග අදාළ වැඩිහිටි සංවිධානයේ ඉල්ලීම නියමිත අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.

2. විධිමත් පිරිවැය ඇස්තමේන්තුව ඉදිරිපත් කල යුතුය

3.රජයේ ඉඩමක් නම් ඒ බවට බවට ප්‍රාදේශිය ලේකම්වරයාගේ තහවුරු ලිපිය ඉදිරිපත් කල යුතුය

4. වැඩිහිටි දිවා ම ධ්‍යස්ථානයක් ඉදිකිරිමට හා ඒ වෙනුවෙන් භූමිය වෙන්කරන බවට ආදාල පාර්ෂව කරුගේ පැවරුම් ලිපිය ඉදිරිපත් කල යුතුය

5. දිවා මධ්‍යස්ථානයක් ලබාදීමට සුදුසු බවට හා සක්‍රිය වැඩිහිටි සමිතියක් බවට ප්‍රාදේශිය ලේකම් ගේ නිර්දේශය සහිත විෂය භාර ක්ෂේත්‍ර නිලධාරී ගේ සවිස්තර වාර්තාව ඉදිරිපත් කල යුතුය

6. මුල්‍ය ප්‍රතිපාදන පහත පරිදි අදියර වශයෙන් කොටස් තුනකින් ලබාදෙන අතර එක් එක් අදියරේ වැඩ අවසන්කර ප්‍රගතිය ලබාදීමෙන් පසුව ඊලඟ අදියරේ මුදල් නිදහස් කරනු ලබයි

- පළමු අදියර - අත්තිකාරම් මුදල
- දෙවන අදියර - ප්‍රාදේශීය ලේකම් නිර්දේශය අනුව
- තෙවන අදියර - වැඩ අවසන් වාර්තාව

7. මහල් වශයෙන් ඉදිකරන්නේ නම් ප්‍රවේශ පහසුකම් වැඩිහිටියන්ට ගැලපෙන පරිදි සකස් කල යුතුය. ( උදාහරණ ආරෝහන - අවරෝහණ මාර්ග)

8. වෙනත් ප්‍රතිපාදන උපයෝගී කරගෙන බහුකාර්ය ගොඩනැඟිල්ලක් ලෙස ඉදිකිරීමේදී ගොඩනැඟිල්ලේ අයිතිය වැඩිහිටි මලේකම් කාර්යාලය සතුවිය යුතුය

09. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුව මිලියන 2.5 උපරිම මුදල ඉක්මවා

යන්නේ නම් එම මුදල දරනු ලබන ආකාරය පිළිබඳ පැහැදිලි කර වැඩිහිටි සංවිධානය විසින් ලිපියක් ඉදිරිපත් කළ යුතුය .

11. වැඩ අවසන්කරන ලද ගොඩනැගිල්ලේ මෙම ගොඩනැගිල්ල ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ “වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල මඟින් ඉදිකරන ලද බවට නාම පුවරුවක් සවි කල යුතුය.

12. ඒ ඒ අවස්ථාවේ පසු විපරම් කටයුතු දිස්ත්‍රික් නිලධාරියා විසින් සිදුකර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඡායාරූප සහිත වාර්තාවක් ඉදිරිපත් කල යුතුය

## 04. පසු විපරම්

(1). මුදල් ලද බවට කුවිතාන්සිය (මුදල් ලැබී සති දෙකක් ඇතුළත) ඉදිරිපත් කල යුතුය

(2). කොන්ත්‍රාත් ගිවිසුමෙ සහතික කළ පිටපත ඉදිරිපත් කල යුතුය

(3). මාසික ප්‍රගති වාර්තාව (ඇමුණුම 1) ඉදිරිපත් කල යුතුය

(4). ව්‍යාපෘති අවසන් වැඩ වාර්තාව (ඇමුණුම 2) ඉදිරිපත් කල යුතුය

(5). දිවා මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ගොඩනැගිල්ල වැඩිහිටි සමිතියට භාරදුන් බව සනාථ කරන

ලිපිය/උපකරණ භාරදුන් බවට ලිපිය ඉදිරිපත් කල යුතුය

(6). වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් අනතුරුව එහි භාණ්ඩ ඉන්වෙන්ට්‍රියක් නඩත්තු කල යුතු අතර

මධ්‍යස්ථානයේ යතුරු සුදුසු පරිදි නිලධාරියෙකු යටතේ තබා ගත යුතුය

## 06. අයදුම්පත් හා ගිවිසුම්

1. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද සම්පූර්න කරන ලද අයදුම් පත්‍රයට අනුවනියමිත පරිදි සම්පූර්ණ කර ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

2. රජයේ ඉඩමක් නොවන ආගමික ස්ථානවල ඉදිකිරීම් සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති ගිවිසුම (පිටපත් දෙකක්)අයදුම් පත්‍රයට අමුණා ඉදිරිපත් කල යුතුය.(අදාල ගිවිසුම ඉදිරියේදී සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ).

අධ්‍යක්ෂ,
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය